

2024

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயற்றிறன் அறிக்கை

Annual Performance Report

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2024

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව



නො.163, කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ,
කොළඹ 05.

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය : 210

2020.01.30 දින රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද ආකෘති පත්‍රය ප්‍රකාරව මෙම වාර්තාව සකස් කොට ඇත.

අන්තර්ගතය

	පටුන	පිටුව
පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	07 - 18
පරිච්ඡේදය 02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	19 - 25
පරිච්ඡේදය 03-	වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	27 - 48
පරිච්ඡේදය 04-	කාර්ය සාධන දර්ශක	49 - 51
පරිච්ඡේදය 05 -	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	53 - 55
පරිච්ඡේදය 06 -	මානව සම්පත් පැතිකඩ	57 - 61
පරිච්ඡේදය 07-	අනුකූලතා වාර්තාව	63 - 76
	අවසානය	77 – 78

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3. ප්‍රධාන කාර්යයන්

1.4. සංවිධාන සටහන

1.5. දෙපාර්තමේන්තුවේ අංශ / ඒකක

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අ). ව්‍යාපෘතිය

ආ). දායක නියෝජිතායතනය

ඇ). ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු.මි.

ඈ). ව්‍යාපෘති කාල සීමාව

1.0 රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

1.1. හැඳින්වීම

බ්‍රිතාන්‍ය යටත් විජිතවාදී පාලන සමයේ දෙවන ලෝක යුද්ධ කාල පරිච්ඡේදයේදී යුද තොරතුරු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා "War Information Centre" නමින් ආයතනයක් ක්‍රියාත්මක විය.

සෝල්බරි කොමිෂන් සභාවේ උපදෙස් හා නිර්දේශ මත ලෝක යුද්ධය නිමා වීමත් සමඟ යුද තොරතුරු මධ්‍යස්ථානය, රජයේ සංවර්ධන කාර්භාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා "රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව" නමින් නව ආයතනයක් ලෙස 1948 ජූලි මස 31 වැනිදා කොළඹ ගාලු මුවදොර මහලේකම් කාර්යාල සංකීර්ණයේ දී ස්ථාපනය කෙරිණ. ආරම්භයේදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,

1. ප්‍රවෘත්ති සැපයීම් අංශය
2. ආණ්ඩුවේ පොත්පත් ආයතනය
3. ආණ්ඩුවේ චිත්‍රපට අංශය

යන අංශ තුනෙන් සමන්විත විය.

රජය ඉටු කරන ජාතික සංවර්ධන කාර්යභාරය ජනතාව අතරට ගෙන යාම සඳහා ප්‍රධාන කාර්යයන් තුනක් මුල් කරගෙන, මෙකී ප්‍රධාන අංශ තුන යටතේ ස්ථාපිත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ එම ප්‍රධාන කාර්යයන් වූයේ,

01. රජයේ සංවර්ධන ප්‍රවෘත්ති හා ප්‍රචාරක කටයුතු මෙහෙයවීම
02. රජයේ නිල ප්‍රකාශන ජනතාව අතරට ගෙනයාම (මුද්‍රණය හා බෙදා හැරීම)
03. රජය ඉටු කරන ජාතික සංවර්ධන කාර්යභාරය පිළිබඳව ගම් මට්ටමින් ජනතාව දැනුවත් කිරීම සඳහා රජයේ චිත්‍රපට අංශය විසින් වාර්තා චිත්‍රපට නිපදවා ප්‍රදර්ශනය කිරීම

යනාදියයි.

ගාලු මුවදොර මහලේකම් කාර්යාල සංකීර්ණයේ සිට ආයතනයේ එක් එක් අංශ වරින්වර විවිධ ස්ථානවල ස්ථාපනය කර තිබේ. ඒ අතර ජාවත්ත වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැඟිල්ල, මොරටුව පොල්වත්තේ වෙලෝනා ගොඩනැඟිල්ල, කොටුව ට්‍රාන්ස්වර්ක් මන්දිරය, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ අතපත්තු ගොඩනැඟිල්ල දැක්විය හැකිය. 90 දශකයේ දී කොල්ලුපිටිය පෞද්ගලික

ගොඩනැඟිල්ලක මහල් දෙකක පවත්වාගෙන ගිය රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව එවකට රජයේ චිත්‍රපට අංශය පවත්වා ගෙන ගිය පොල්හේන්ගොඩ පරිශ්‍රයට එනම් වත්මන් පරිශ්‍රයම තුළ තිබේ. එතැන් සිට මෙම පරිශ්‍රයේ නව ගොඩනැඟිලි ඉදිකරමින් ආයතනයේ සියලු අංශ එක් පරිශ්‍රයක සිට ක්‍රියාත්මක කිරීමට ආයතන ප්‍රධානීන් කටයුතු කර ඇත.

මෙකී කාර්යභාරය ඉටු කිරීම සඳහා පළපුරුදු, දක්ෂ ජනමාධ්‍යවේදියෙකු මෙන්ම පුවත්පත් කතුවරයෙකු වූ එච්.ඒ.ජේ. හුළුගල්ල මහතා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රවෘත්ති නිලධාරියා ලෙස පත් කරනු ලැබීය. එසේම සහකාර ප්‍රවෘත්ති නිලධාරීන් ලෙස පී.එන්. මැද්දේගොඩ, එල්.ආර්. ගුණතිලක, එස්.පී. වෙත්තසිංහ, පී.බී. විජේසිංහ යන මහත්වරුන් කටයුතු කර තිබේ.

දෙපාර්තමේන්තුවේ ආරම්භක ප්‍රධානියා හෙවත් ප්‍රවෘත්‍යාධිකාරී වූයේ පී. නඩේශන් මහතා ය. මෙම ප්‍රවෘත්‍යාධිකාරී තනතුර පසුව ප්‍රවෘත්ති අධ්‍යක්ෂ හා 2009 වර්ෂයේ සිට ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් දක්වා තනතුර උසස් වී තිබේ. එතැන් පටන් ප්‍රවීණ ජනමාධ්‍යවේදීන්, මාධ්‍ය වෘත්තිකයන් හා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලදාරීන් විසින් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් තනතුර හෙබවූ අතර 2024.10.01 සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු වන එච්.එස්.කේ.ජේ. බණ්ඩාර මහතා එම රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ කටයුතු කරමින් සිටී.

රජයේ ආයතන අතර ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සුවිශේෂී වැදගත්කමක් හිමි කර ගන්නේ සෘජුවම මහජනතාවට පුවත් සපයන මාධ්‍ය ආයතන සමග සම්බන්ධ ආයතනය නිසාවෙනි. ඉන් නිකුත් කෙරෙන නිවේදනයක් රජයේ නිල නිවේදනයක් වන්නා සේම එය අතිශයින් නිවැරදි තොරතුරුවලින් සමන්විත විය යුතුමය.

එසේ පුවත් සපයන අතර එක්, එක් වකවානුවලදී රජය ගන්නා තීරණ අනුව කටයුතු කිරීමට ද සිදු වී ඇත. 1979, 1980, 1981, 1983,1987,1995,1996 හා 2000 යන වර්ෂවලදී රජය පුවත් වාරණය කළ අතර, එම අවස්ථාවල රටේ කලබලකාරී වාතාවරණයක් පැවතීම ඊට හේතු විය. එවැනි අවස්ථාවලදී පුවත් වාරණය රජයේ නිසි බලධරයා ලෙස ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයාට පැවරුණු රාජකාරියක් විය.

රාජ්‍ය ජනමාධ්‍ය ව්‍යුහයේ පැවති සීමා හඳුනාගෙන ජනතාව වඩාත් සංවර්ධන කාර්යභාරයට දායක කර ගැනීම රජයේ අරමුණ වූයෙන්, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම, සර්වජන ඡන්දබලයේ ජනතා මෙහෙවර යනාදී කරුණු පිළබඳව ජනතාව දැනුවත් කිරීමේදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට පැවරුණු වගකීම වඩාත් සාර්ථකව ඉටු කිරීමට රජයේ චිත්‍රපට අංශය ඉතා පුළුල් මෙහෙවරක් ඉටු කර තිබේ. ජුලියෝ පෙට්ට්‍රෝනි මහතාගෙන් ආරම්භ වූ රජයේ චිත්‍රපට අංශය, නිදහසින් පසු මෙරට සිදු වූ ජාතික සංවර්ධනය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා සුවිශාල මෙහෙවරක් ඉටු කර ඇත. ඒ වාර්තා චිත්‍රපට නිෂ්පාදනය මගිනි. පසුකාලීනව කීර්තිමත් වාර්තා චිත්‍රපට අධ්‍යක්ෂවරුන් රාශියක් බිහි කළ මෙම අංශය, පැරිස් ජාත්‍යන්තර චිත්‍රපට උළෙල ආදී විදේශ සිනමා සම්මාන උළෙල රාශියකදී වාර්තා හා අර්ධ වාර්තා අංශයෙන් ශ්‍රී ලංකාවට සම්මාන දිනා දී ඇත.

ප්‍රජාතන්ත්‍රවාදී රටක් තුළ සියලුම පුරවැසියන්ට රාජ්‍ය ප්‍රතිපත්ති හා රජය මගින් සලස්වනු ලබන සේවා,නීති රීති පිළිබඳ තොරතුරු ක්‍රමවත්ව හා විශ්වාසදායක ලෙස නීත්‍යානුකූලව ප්‍රකාශන මගින් දැනුවත් කිරීමට සැලැස්වීම හා දෙපාර්තමේන්තු ප්‍රකාශන නොවන රජයේ ප්‍රකාශන විකිණිම, ගබඩාකර තබා ගැනීම හා බෙදාහැරීම රජයේ ප්‍රකාශන කාර්යාංශය මඟින් සිදු කරයි. රජයේ ප්‍රකාශන කාර්යාංශය ද ඉතා පුළුල් අරමුණක් යටතේ පවත්වාගෙන යමින් රජයේ නිල ප්‍රකාශන පිළිබඳව නීති, අණපනත් මහජනතාවට මිලදී ගැනීම සඳහා මුද්‍රණය කර බෙදා හැරීමට කටයුතු කර තිබේ. මෙහි ආරම්භක නිලධාරියා ලෙස සේවය කර ඇත්තේ R.V.H. Vantwest මහතාය.

ආරම්භක යුගයේ සිටම රජයේ ප්‍රචාරන වැඩපිළිවෙළ දේශීය වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් ද ඉටු කළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ විදේශ තානාපති කාර්යාල ඉලක්ක කර ගෙන අත්පත්‍රිකා, සඟරා හා ප්‍රකාශන නිතිපතා බෙදා හැරීමට ද කටයුතු කර තිබේ. මෙම කාල පරිච්ඡේදයේදී විදේශ තානාපති කාර්යාල ඉලක්ක කර ගෙන පළ කරනු ලැබූ “Week Happening in the Island” සඟරාවද “Introduction Ceylon” ආදී ප්‍රකාශන තුළින් ශ්‍රී ලංකාව පිළිබඳව විශේෂ තොරතුරු විදේශ රටවලට ලබා දීමට කටයුතු කර තිබේ. පසු කාලයේදී ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු විදේශයන්හි ප්‍රචාරය කිරීම සඳහා “Sri Lanka Today” නමින් ත්‍රෛමාසික සඟරාවක් ද පළ කර තිබේ.

රජයේ චිත්‍රපට අංශය ශ්‍රී ලංකාවේ සමාජ සංස්කෘතික සහ ආර්ථික සංසිද්ධීන් ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයෙන් ප්‍රතිනිර්මාණය කළ පුරෝගාමීම ආයතනයයි. විශේෂයෙන් වාර්තා වැඩසටහන් නිර්මාණකරණය සහ ප්‍රවෘත්ති පට නිර්මාණය මගින් 1948 සිට මේ දක්වා මෙරට සිදුවූ සමාජ දේශපාලන සංස්කෘතිය සංසිද්ධීන් ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයෙන් ප්‍රතිනිර්මාණය කර අනාගතය වෙනුවෙන් සංරක්ෂණය කරනු ලබන එකම රාජ්‍ය ආයතනයයි. මුල් වකවානුවේ චිත්‍රපට මාධ්‍යයෙන් නිර්මාණකරණය කරන ලද නමුත් මේ වන විට නව තාක්ෂණය සමඟ සම්බන්ධව ඩිජිටල් වීඩියෝ මාධ්‍යයෙන් වාර්තා වැඩසටහන් සහ ප්‍රවෘත්තිපට ඇතුළු ශ්‍රව්‍ය දෘෂ්‍ය වැඩසටහන් නිර්මාණය කරමින් සිටින රාජ්‍ය ආයතනයකි.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සලකුණක් වන සක්වල අතැඹුලක් කළ "දෙසතිය" සඟරාව, එහි මංගල කලාපය එළිදුටු 1978 පෙබරවාරි 04 වැනිදා සිට දශක පහකට ආසන්න කාලයක් මුළුල්ලෙහි තීරණාත්මක සංදිස්ථාන පසුකර අඛණ්ඩව ජන මතය පෝෂණය කරමින් සිටි. ශ්‍රී ලංකේය ජන සන්නිවේදන ක්ෂේත්‍රයේ හැරවුම් ලක්ෂයක් වන මෙකී දෙසතිය සඟරාවෙන් පෝෂණය වූ ලේඛන පරපුර බොහෝය. මෙරට ප්‍රතිපත්ති තීන්දු කරන්නාගේ සිට ගොවියා, කම්කරුවා දක්වා නියෝජනය කරන ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයෙන් හඳුන්වා දුන් එකම පුවත් සඟරාව වන “දෙසතිය”, විශේෂයෙන්ම රජයේ ප්‍රතිපත්ති හා සංවර්ධන වැඩපිළිවෙල ජනතාගත කිරීමේ කාර්යය ද සමඟ දෙසතිය ඉන් ඔබ්බට ගොස් ජන මනසේ බුද්ධිමය විප්ලවයක් ඇති කිරීමට සමත් විය. සමාජීය, ආර්ථික, සංස්කෘතික, කලා, ජාත්‍යන්තර සහ තවත් බොහෝ ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු ඉතාමත් සරල බස් වහරකින් පාඨක රුචිය වඩවන ලෙස දෙසතිය සඟරාවෙන් ඉදිරිපත් කරයි.

1993 දී රාජ්‍ය නොවන රූපවාහිනී නාලිකාවන්ට ප්‍රථම වරට ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීමට රජය අවසරදීම මෙරට මාධ්‍ය ඉතිහාසයේ වැදගත් සිදුවීමක් ලෙස සැලකිය හැකි වේ. මීට සමගාමීව මහජනයාට අවශ්‍ය තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සඳහා 1995 මැයි 18 වැනිදා ජාතික තොරතුරු මධ්‍යස්ථානය බිහි කිරීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ තවත් එක් ඉදිරි පියවරක් විය. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන සියලුම මාධ්‍ය ආවරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ඒ සම්බන්ධ සියලු කටයුතු සංවිධානය කිරීම සිදු කරයි ප්‍රචාරණ ඒකකය මඟින් සිදු කරනු ලබයි. රජයේ නිල ප්‍රවෘත්ති නිවේදන, රජයේ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ ප්‍රවෘත්ති නිවේදන ඇතුලු ප්‍රවෘත්ති නිවේදන මාධ්‍ය ආයතන වෙත නිකුත් කිරීම, අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීමේ ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය කිරීම,අමාත්‍ය මණ්ඩල තීරණ භාෂා ත්‍රිත්වයෙන්ම සකස්කර මාධ්‍ය වෙත නිකුත් කිරීම, මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම, ජාතික සහ ජාතික වශයෙන් වැදගත්වන උත්සව අවස්ථාවන්වල මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම, විදේශීය රාජ්‍ය තාන්ත්‍රිකයින්ගේ ශ්‍රී ලංකා නිල සංචාර සම්බන්ධයෙන් මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම, Guide to Media සහ Guide to Ministry දුරකථන නාමාවලීන් පිළියෙල කිරීම, මාධ්‍ය වැඩමුළු හා සාකච්ඡා සංවිධානය කිරීම, කාලීන අවශ්‍යතාවය අනුව මාධ්‍යවේදීන්ට අවශ්‍ය පහසුකම් ලබා දීමට සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි විශේෂ වාර්තා සකස් කිරීම ආදිය සිදු කරයි.

1948 නිදහසත් සමග ඇති කරන ලද දෙපාර්තමේන්තු ආකෘතිය යටතේ යාහැකි උපරිමය දක්වා යන, සිය ගමන් මගේ එදාට වඩා පසුගිය වර්ෂවල නවීන ලෝකයට ගැලපෙන ආකාරයෙන් සංවිධිත වී ඇති රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව 2024 වන විට අංශ කිහිපයකින් සිය සේවාවන් පවත්වා ගෙන යයි. රජයේ චිත්‍රපට අංශය, ඡායාරූප ඒකකය, රජයේ සමාජ මාධ්‍ය ඒකකය, දෙසතිය හා ප්‍රකාශන ඒකකය, නව මාධ්‍ය ඒකකය (www.news.lk), රජයේ ප්‍රකාශන කාර්යාංශය, මාධ්‍ය හැඳුනුම්පත් ඒකකය, ප්‍රචාරක ඒකකය සහ මාධ්‍ය විමර්ශන හා ජනමාධ්‍ය පර්යේෂණ ඒකකය, විදේශ ප්‍රවෘත්ති ඒකකය, පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධන සංවර්ධන ඒකකය යන අංශ හා ඒකකවලින් සමන්විත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී ආයතනයක් බවට පත් වී ඇත.

මෙම කාර්යභාරය කාලීන වෙනස්කම්වලට ලක් වෙමින් වර්තමානය දක්වාම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යුහුසුළු වනවාක් මෙන්ම පවත්නා යාන්ත්‍රණයන් තුළින් ඒ සඳහා ඉඩ හසර වෙන් කර ගන්නා බවද නිරීක්ෂණයේදී පැහැදිලි වේ.

❖ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානීන්

1948 සිට රජයේ ප්‍රවාත්ති දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානීන් ලෙස ප්‍රවෘත්ත්‍යාධිකාරී, ප්‍රවෘත්ති අධ්‍යක්ෂ සහ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් යන තනතුරු නාම දරමින් පහත නිලධාරීන් කටයුතු කර ඇත.

1948 - පී. නඩේශන් මහතා

1949 - ඩී.අයි.එච්.ඒ.ජේ.හුළුගල්ල මහතා

1950 - වී.ටී.ආර්.විවියන් හොරයින් මහතා

1952 - ඩී.අයි.එච්.ඒ.ජේ.හුළුගල්ල මහතා

1955 - නඩේශන් පරරාජශිංගම් මහතා

1956 - ජී. ලයනල් පෙරේරා මහතා

1957 - ජී.ඩබ්.ඒ.එම්.පෙරේරා මහතා

1958 - ජේම්ස් පෙරේරා මහතා

1959 - ටී.එම්. ජයරත්නම් මහතා

1960 - තිලක් එරංග ගුණරත්න මහතා

1961 - ඩබ්.එල්. ප්‍රනාන්දු මහතා

1962 - එස්.බී. සේනානායක මහතා

1966 - ඩී. අළුවිහාරේ මහතා

1967 - පී.එන්. මැද්දේගොඩ මහතා

1968 - ආචාර්ය එස්.එල්.බී. අමුණුගම

1972 - පී.එච්. ප්‍රේමවර්ධන මහතා

1974 - ඩබ්.ආර්.පී. තිලකරත්න මහතා

1977 - එස්. අනුර ගුණසේකර මහතා

1983 - මානෙල් අබේරත්න මහත්මිය

1990 - කේ.එස්. විමලසේන මහතා

1991 - කේ.ආර්.එල්. විජේවර්ධන මහතා

1992 - මහාචාර්ය සුනන්ද මද්දුමබණ්ඩාර

1994 - ආරිය රූබසිංහ මහතා

2003 - කේ.ඒ.බී.ජේ.පී. ජයසේකර මහතා

2004 - ඩබ්.එම්. පියසේන මහතා

2005 - කාන්ති විජේතුංග මහත්මිය

එස්.ඩී. පියදාස මහතා

2006 - වී.පී.කේ. අනුෂ පැල්පිට මහතා

❖ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරුන්

2009.02.01 දින සිට 2010.05.06 දින දක්වා - වී.පී.කේ. අනුෂ පැල්පිට මහතා

2010.05.07 දින සිට 2015.01.08 දින දක්වා - මහාචාර්ය ආරියරත්න ඇතුගල

2015.01.13 දින සිට 2015.05.07 (වැ.බ.) දින දක්වා- කේ.ඩබ්.ටී.එන්. අමරතුංග මහත්මිය

2015.05.08 දින සිට 2017.06.02 දික දක්වා - ආචාර්ය දර්ශනී ගුණතිලක

2016.06.06 දින සිට 2017.09.29 දින දක්වා - ආචාර්ය රංග කලන්සූරිය

2017.10.13 දින සිට 2018.10.26 දින දක්වා - නීතිඥ සුදර්ශන ගුණවර්ධන

2018.10.27 දින සිට 2021.04.07 දින දක්වා - කේ.එම්.ජී.එස්. නාලක කලුවැව මහතා

2021.04.19 දින සිට 2022.09.07 දින දක්වා - මොහාන් සමරනායක මහතා

2022.09.08 දින සිට 2024.09.30 දින දක්වා - දිනිත් චින්තක කරුණාරත්න මහතා

2024.10.01 දින සිට මේ දක්වා - එච්.එස්.කේ.ජේ. බණ්ඩාර මහතා

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

❖ දැක්ම

"නිදහස් හා වගකීමෙන් යුතු මාධ්‍ය සම්ප්‍රදායක් උදෙසා දායක වීම"

❖ මෙහෙවර

"ශ්‍රී ලාංකේය සන්නිවේදන මාධ්‍ය අතර සුහදශීලි පරිසරයක් නිර්මාණය කිරීම හා මාධ්‍ය සංස්කෘතිය නඟා සිටුවීම සඳහා අවශ්‍ය මෙහෙයවීම සිදුකරමින් නිවැරදි තොරතුරු හා රජයේ දැක්ම දැන ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම''

❖ අරමුණු

- ජාතික වශයෙන් වැදගත්වන්නා වූ හා රජයේ ප්‍රතිපත්ති, සැලසුම් හා සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම.
- උසස් මාධ්‍ය සංස්කෘතියක් බිහිකිරීම.
- වැදගත් හා කාලීන සිදුවීම්, රජයේ තොරතුරු හා සිදුවීම් ශ්‍රව්‍ය, දෘෂ්‍ය හා මුද්‍රිත මාධ්‍යයන් යොදා ගනිමින් වාර්තාගත කිරීම හා ඒවා සංරක්ෂණය කිරීම.
- මාධ්‍ය ක්ෂේත්‍රයට අවශ්‍ය වන්නා වූ මානව හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම.
- මාධ්‍ය ක්ෂේත්‍රය හා මාධ්‍ය වේදීන්ට අවශ්‍ය පහසුකම් සැපයීම, පුහුණුව ලබා දීම හා අවශ්‍ය අවස්ථාවන්හි දී සුබසාධන කටයුතු සඳහා නායකත්වය දැරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

ඉහළ සංවර්ධන මට්ටමක් සහ තිරසාර ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ආයතන සහභාගී කර ගනිමින් සන්නිවේදනයෙන් දායක වීම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වන්නේය.

- අමාත්‍යාංශයන්හි අදාළ තොරතුරු ජනමාධ්‍ය වෙත නිකුත් කිරීම.
- රජයේ සංවර්ධන ක්‍රියාදාමය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
- ජාතික වශයෙන් වැදගත් අවස්ථාවන් සහ හදිසි තත්ත්වයන් පිළිබඳව දැනුවත් කිරීම.
- රජයේ සංවර්ධන ප්‍රගතිය පිළිබඳ චිත්‍රපට හා වීඩියෝ දර්ශන මාර්ගයෙන් මහජනතාව දැනුවත් කිරීම.
- රජයේ සංවර්ධන තොරතුරු ඓතිහාසික තොරතුරු හා අනෙකුත් කාලයේ වැදගත්කමක් ඇති තොරතුරු පිළිබඳ ප්‍රවෘත්ති හා වාර්තා වීඩියෝ චිත්‍රපට නිෂ්පාදනය කිරීම.
- පර්යේෂණාත්මක වාර්තා චිත්‍රපට නිෂ්පාදනය.
- විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා දේශීය තොරතුරු විදේශ වලටත්, විදේශ තොරතුරු මෙරට ජනතාවටත් ලබා දීම.
- රජයේ සමාජ මාධ්‍ය ඒකක හා News.lk වෙබ් අඩවිය භාෂාත්‍රයෙන්ම පවත්වාගෙන යාම.
- දෙසතිය සඟරාව, රජයේ සංදේශය හා විමර්ශන සඟරා යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- රජයේ ප්‍රකාශන කාර්යාංශය ක්‍රියාකාරීව පවත්වාගෙන යාම. (දිස්ත්‍රික් ප්‍රකාශන කවුළු 07 ද ඇතුළුව)
- දේශීය හා විදේශීය මාධ්‍යවේදීන් ජාතික මෙහෙවර සහ රාජතාන්ත්‍රික උත්සව සඳහා සම්බන්ධීකරණය
- ප්‍රාදේශීය සංවර්ධන ප්‍රයත්න සහ අමාත්‍යාංශයන්හි නව වැඩ පිළිවෙල ජනතාව අතරට ගෙනයාම සඳහා මාධ්‍ය චාරිකා සංවිධානය කිරීම
- ජාතික වශයෙන් වැදගත් උත්සව වල ප්‍රධාන මාධ්‍ය සම්බන්ධීකාරක වශයෙන් ක්‍රියා කිරීම.
- වෘත්තිය ප්‍රාදේශීය හා විදේශ මාධ්‍යවේදීන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම.
- රේඛීය අමාත්‍යාංශයන්හි මාධ්‍ය ඒකක සමඟ සමීප සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.
- කාලීන හා ජාතික වශයෙන් වැදගත් වන සිදුවීම් වලට අදාළ පොත් මුද්‍රණය කිරීම (ADB හා UNDB ආදී ආයතන සමඟ සම්බන්ධ වී අවශ්‍ය මූල්‍ය පහසුකම් සලසා ගැනීම)
- ජනාධිපතිවරයාගේ දේශීය හා විදේශීය නිල උත්සවයන්හි මාධ්‍ය ආවරණය මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය වාර්තා වශයෙන් රැස් කිරීම.
- දෛනික භාෂාත්‍රයෙන්ම පලවන පුවත්පත් වාර්තා විශ්ලේෂණය කර ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
සංවිධාන සැලැස්ම 2024

1.5. දෙපාර්තමේන්තුවේ අංශ / ඒකක

1. පාලන අංශය
2. ගිණුම් අංශය
3. අභ්‍යන්තර විගණක ඒකකය
4. නිෂ්පාදක ඒකකය
5. සංස්කරණ ඒකකය
6. සජීවීකරණ මැදිරි ඒකකය
7. ශබ්ද හා ශ්‍රවණාගාර ඒකකය
8. වීඩියෝ කැමරා හා ආලෝකකරණ ඒකකය
9. ඩිජිටල් සංරක්ෂණ හා රසායනාගාර ඒකකය
10. චිත්‍රපට සංරක්ෂණ ඒකකය
11. ඡායාරූප ඒකකය
12. ප්‍රචාරක ඒකකය
13. වෙබ් හා මාධ්‍ය සමාජ ඒකකය
14. දෙසතිය හා ප්‍රකාශන ඒකකය
15. දිස්ත්‍රික් මාධ්‍ය ඒකක සම්බන්ධීකරණ ඒකකය
16. මාධ්‍ය හැඳුනුම්පත් ඒකකය
17. ඩිජිටල් හා තොරතුරු තාක්ෂණ ඒකකය
18. රජයේ ප්‍රකාශන කාර්යාංශය
19. ජනමාධ්‍ය පර්යේෂණ ඒකකය
20. මාධ්‍ය විමර්ශන ඒකකය
21. විදේශ ප්‍රවෘත්ති ඒකකය
22. පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධනය සංවර්ධන ඒකකය
23. පුස්තකාලය
24. ප්‍රවාහන ඒකකය
25. භාෂා පරිවර්තක ඒකකය
26. නඩත්තු ඒකකය
27. ගබඩාව

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන

- දිස්ත්‍රික් මාධ්‍ය ඒකක

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යටතේ දිස්ත්‍රික්ක 25 ක් පුරා දිස්ත්‍රික් මාධ්‍ය ඒකක ස්ථාපිත කර ඇත.

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

- රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විදේශ ආධාර ලබන ව්‍යාපෘති නැත.

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

❖ ප්‍රගතිය හා ඉදිරි දැක්ම

නවීන තාක්ෂණයත් සමඟ වර්තමානයේ දෛනික කටයුතු සම්ප්‍රදායික ක්‍රමවල සිට ඩිජිටල්කරණයට (Digitalization) ලක් කර එම කාර්යයන් වඩාත් පහසුවෙන් ඉටු කිරීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ඉදිරියට පියවර තබමින් සිටියි.

සියලු මාධ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් ප්‍රවෘත්ති / තොරතුරු සම්පාදන මූලාශ්‍රය ලෙස රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව කටයුතු කරන අතර, රජයේ සියලු කාලීන හා සංවර්ධන තොරතුරු රජයේ සහ පෞද්ගලික මුද්‍රිත විද්‍යුත් මාධ්‍ය වෙත ලබාදීමේ රජයේ යාන්ත්‍රණය ලෙස ක්‍රියා කරයි.

එසේම වර්තමානයේ ඩිජිටල් අවකාශය තුළ ජනතාවට විශ්වසනීය තොරතුරු සන්නිවේදනය කිරීමේ ඩිජිටල් වේදිකාව මෙම වසරේ ඉහළ මට්ටමට ගෙන ඒමට හැකි වීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි.

දෙපාර්තමේන්තුව යටතේ පවතින වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය ජාල කඩිනමින් තොරතුරු සන්නිවේදනය කරන ජාලයන් වීම විශේෂත්වයකි.

❖ ඩිජිටල්කරණයේ සුවිශේෂී අවස්ථා

සමාජ මාධ්‍ය ජාලය තුළ බොහෝ අවස්ථාවල සාවද්‍ය තොරතුරු සංසරණය වන බැවින් හැම විටම ජනතාවට ලැබෙන තොරතුරුවල නිරවද්‍යභාවය, විශ්වසනීයත්වය සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව www.dgi.gov.lk, “Department of Government Information” YouTube නාලිකාව, FaceBook පිටුව, www.news.lk වෙබ් අඩවිය, YouTube නාලිකාව, FaceBook පිටුව හා X Crop. (Twitter) යන සියලු ජාල ඔස්සේ විශ්වසනීය තොරතුරු ජනතාව වෙත සෘජුව සන්නිවේදනය කරයි.

මාධ්‍ය වෙත පහසුකම් සැලසීම		
	වැඩසටහන	**ක්‍රියාත්මක කිරීම**
01	මාධ්‍ය වෙත තොරතුරු සන්නිවේදනය සඳහා cloud අවකාශය භාවිතය	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, මාධ්‍ය වෙත තොරතුරු සම්පාදන මූලාශ්‍රය ලෙස සාම්ප්‍රදායික ක්‍රමයෙන් ඔබ්බට ගොස් වීඩියෝපට, හඬ පට, ඡායාරූප, ප්‍රවෘත්ති නිවේදන සියල්ල සියලු මාධ්‍ය වෙත එකම මොහොතක් තුළ කඩිනමින් ලබා දෙයි.
02	දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන සියලුම මාධ්‍ය ආවරණ මාධ්‍ය වෙත කඩිනමින් නිකුත් කිරීම	රජය ක්‍රියාත්මක කරන වැඩසටහන් සම්බන්ධ සියලු තොරතුරු ඇතුළත් නිවේදන සහිතව වීඩියෝපට, හඬ පට, ඡායාරූප යනාදිය මාධ්‍ය වෙත නිකුත් කරයි පෙර ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් නොතිබුණු අතර, දැන් මනා සම්බන්ධීකරණයෙන් සියලුම මාධ්‍ය ආයතන සහභාගී කර ගැනීමට හැකි වී තිබේ.
03	Bulk E mail System සකස් කිරීම	මුද්‍රිත, විද්‍යුත්, වෙබ් මාධ්‍ය, නව මාධ්‍ය, විදෙස් මාධ්‍ය ඇතුළු සියලුම මාධ්‍යයන් වෙනුවෙන් 200කට ආසන්න ඊමේල් පද්ධතියක් තුළින් තොරතුරු හුවමාරු කර ගනු ලැබේ.
04	මාධ්‍ය වෘත්තිකයන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත නිකුත් කිරීම	ලිපිගොනු පාදක කොටගෙන මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම වෙනුවට වාර්තා ගත දත්ත පද්ධතියක් (Data Base) භාවිතයෙන් එය ඉටු කිරීමට කටයුතු කරනු ලැබේ.

ජනතාව වෙත සෘජුව තොරතුරු ලබාදීම		
	“Department of Government Information” YouTube විකාශය පවත්වාගෙන යාම	Department of Government Information You Tube නාලිකාව 2023 හා සසඳන විට 2024 වර්ෂයේ ප්‍රේක්ෂක සංඛ්‍යාව විශාල වශයෙන් වර්ධනය විය. එහිදී වීඩියෝ පට විවිධ තේමා ඔස්සේ සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබේ. එනම්, INFO News, INFO Highlights, ඇතුළාන්තය (Inside), INFO News Parliament Highlights, Provincial Highlights, Taller, Documentary, Short Video Reel ආදී වශයෙනි. ඒ අනුව YouTube නාලිකාව වෙත 6000 කට අසන්න වීඩියෝ පට මුදා හැර ඇති අතර දෙස - විදෙස් විශාල ජනතාවක් මෙම YouTube නාලිකාව සමග එක්ව සිටිමින් YouTube නැරඹුම් වාර මිලියනයේ සීමාව පසු කර ඉහළ ජනතා ප්‍රසාදයක් ලබා ගැනීමට හැකියාව ලැබී ඇත.
	“Department of Government Information” FaceBook පිටුව පවත්වාගෙන යාම	මේ වන විට දෙපාර්තමේන්තුවේ Facebook පිටුව සමඟ 200,000 යේ සීමාව පසුකරමින් අනුගාමිකයින් පිරිසක් (Followers) එක්ව සිටිති. එමඟින් Facebook නැරඹුම් වාර මිලියන ද පසු කිරීමට හැකියාව ලැබුණි. ඒ අනුව අන්තර්ගතය විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ සකස් කිරීමට අවධානය යොමු වූ පසු Facebook like, people reached, engage සංඛ්‍යාව දිනෙන් දින ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකි විය. කාලීන හා සංවර්ධන ප්‍රවෘත්ති ඇතුළත් වීඩියෝ පට (You Tube නාලිකාවේ සියලුම වීඩියෝ) නිර්මාණාත්මක post සහ ඡායාරූප කෙටි විස්තරයක් සහිතව මෙහි යාවත්කාලීන කිරීම සිදු වේ. මේ වන විට සතියකට ලක්ෂයට වැඩි reached සංඛ්‍යාවක් පවත්වා ගෙන යාමට හැකි වී තිබේ.

	www.news.lk web අඩවිය	කාලීන හා සංවර්ධන සියලුම ප්‍රවෘත්ති මෙම වෙබ් අඩවිය ඔස්සේ යාවත්කාලීන කිරීම, භාෂා ත්‍රිත්වයෙන්ම සිදු වන අතර පැය 24 පුරා යාවත්කාලීන වන රජයේ නිල පුවත් වෙබ් අඩවිය මෙයයි. මෙම වෙබ් අඩවිය යටතේ Facebook පිටුව, Youtube නාලිකාව, X Crop. (Twitter) පිටු ක්‍රියාත්මක වේ. එසේම කැබිනට් මාධ්‍ය සාකච්ඡාව ඇතුළු විශේෂ මාධ්‍ය සාකච්ඡා සජීවී විකාශය පවත්වාගෙන යාම ආරම්භ කර ඇති අතර ඒ සඳහා ඉහළ ප්‍රතිචාර ලැබෙමින් පවතී.
	දෙසතිය සඟරාව	ජනතාව වෙත කාලීන හා සංවර්ධන මෙන්ම විදෙස් තොරතුරු කැටි කරගත් වසර 44ක ඉතිහාසයකට හිමිකම් කියන දෙසතිය සඟරාව නියමිත පිරිදි, 2024 වර්ෂය තුළ ඉතා ඉහළ නිමාවකින් හා ප්‍රමිතියකින් යුතුව දෙසතිය සඟරා දොළහක් (12) මුද්‍රණය කර ඇත.
මාධ්‍ය සංරක්ෂිත පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.		
	ඩිජිටල් සංරක්ෂිත පද්ධතියක් ස්ථාපිත කිරීම	දෙපාර්තමේන්තුව සතුව පවතින ඓතිහාසික වැදගත් චිත්‍රපට, වීඩියෝ පට, ඡායාරූප යනාදිය ඩිජිටල් තාක්ෂණයට හැරවීමේ (Convert to Digital) ව්‍යාපෘතියක් ද ආරම්භ කර තිබේ. මේ වන විට පැරණි චිත්‍රපට 467ක් පමණ ඩිජිටල් තාක්ෂණයට convert කර, සංරක්ෂණය කිරීමට කටයුතු යොදා ඇත ඊට අමතරව ඩිජිටල් සංරක්ෂිත පද්ධතිය ස්ථාපනය කිරීම පසුගිය වසරේ සිදු වූ ප්‍රධාන කාර්යයක් වූ අතර එහි විශේෂිත වූ වීඩියෝ පට, ඡායාරූප සංරක්ෂණය කිරීම එදිනෙදා සිදු කෙරෙන කාර්යයක් බවට මෙම වසර තුළ ද පත් කිරීමට හැකිවීම.

- **මාධ්‍ය වෙත තොරතුරු ලබාදීමේ පහසුකම් විධිමත් ලෙස පුළුල් කිරීම**

යහපත් සමාජ පැවැත්මක් උදෙසා විශ්වසනීයත්වයෙන් සත්‍ය තොරතුරු වාර්තාකරණය උදෙසා මාධ්‍ය ආයතන තොරතුරුවලින් සන්නද්ධ කිරීම කාලීන අවශ්‍යතාවකි. රජයේ සංවර්ධන හා කාලීන තොරතුරු විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ මාධ්‍ය වෙත සන්නිවේදනය කිරීම පිණිස රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව Cloud තාක්ෂණය භාවිත කරමින් මාධ්‍ය ආයතන වෙත වීඩියෝ පට, ඡායාරූප, මාධ්‍ය නිවේදන යන සියල්ල කඩිනමින් ලබාදීමේ විධිමත් ක්‍රමවේදය ආරම්භ කර තිබේ.

- **විශේෂ ජයග්‍රහණ,**

1. “ෂින්හුවා” පුවත් ආයතනය (Xinhua News Agency) සහ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව අතර අවබෝධතා ගිවිසුම අත්සන් තැබීම.

2. අනුරාධපුර දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය මගින් නිෂ්පාදනය කළ "මානෑව කන්ද" පිළිබඳ වාර්තා වැඩසටහන උතුරු මැද පළාත් කලා උළෙලේදී හොඳම අධ්‍යක්ෂණය, තිරපිටපත, කැමරාකරණය සඳහා සම්මානයට පත්‍ර වීම.

3. 2025 පාර්ලිමේන්තු මැතිවරණයේ සජීවී ප්‍රතිඵල විකාශය සාර්ථකව සිදු කිරීම. ඒ සඳහා DGI YouTube පිටුව තුළින් 73,000 ක නරඹන්නන් ප්‍රමාණයක් හා Event TV තුළින් 5000 ක නරඹන්නන් ප්‍රමාණයක් සජීවීව සම්බන්ධවීම.

4. දෙසතිය සඟරාව E-Magazine ලෙස පල කිරීම.

5. කොරියානු “KOICA Invitational Fellowship Training Programme” විදේශ පාඨමාලාවේ අදියර 03 සාර්ථකව නිම කිරීම.

6. මුද්‍රිත, විද්‍යුත්, වෙබ් මාධ්‍ය, නව මාධ්‍ය, විදෙස් මාධ්‍ය ඇතුළු සියලුම මාධ්‍යයන් වෙනුවෙන් සෘජුව තොරතුරු නිකුත් කිරීම සඳහා ඊමේල් පද්ධතියක් සකස් කිරීම.

❖ අනාගත ඉලක්ක

(i) රටේ සියලු පුරවැසියන්ට කාර්යක්ෂමව නිවැරදි තොරතුරු ලබා ගැනීමේ ප්‍රවේශයන් පුළුල් කිරීම.

(ii) රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් පිළිබඳ තොරතුරු ජනතාව අතරට ගෙන යාම.

(iii) දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුමෙන් හා අත්දැකීමෙන් සන්නද්ධ කිරීම.

(iv) මාධ්‍ය සාක්ෂරතාවය ඇති කිරීම.

(v) පාසල් මට්ටමින් මාධ්‍ය අධ්‍යාපනය පුළුල් කිරීමට කටයුතු කිරීම.

(vi) මාධ්‍ය විශ්ලේෂණ වාර්තා භාවිත කරන රාජ්‍ය නිලධාරීන්ගේ තෘප්තිමත්භාවය වැඩිදියුණු කිරීම.

(vii) සංරක්ෂිත මාධ්‍ය පර්යේෂණ පරිශීලකයන්ගේ තෘප්තිය වැඩි දියුණු කිරීම.

එච්.එස්.කේ.පේ. බණ්ඩාර
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්/ගණන්දීමේ නිලධාරි

03 පරිච්ඡේදය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසිඒ - එල්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2024		සටහන	2024	තත්‍ය නැවත ගලපන ලද 2023	
			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**				
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	ඒසිඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		340,319,000	311,417,000	ඒසිඒ-3
-	තැන්පතු		5,148,436	4,909,612	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		12,704,762	16,318,794	ඒසිඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**358,172,198**	**332,645,406**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)**		**358,178,198**	**332,645,406**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		280	4,061	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) – (ඇ)		**358,171,918**	**332,641,345**	
	අඩු කළා : වියදම්				

-	**පුනරාවර්තන වියදම්**		-	-	
211,771,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	189,321,489	186,883,460	
137,402,735	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	115,880,417	110,2001008	ඒසිඒ-2(ii)
1,650,000	සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම්	7	832,395	1,054,041	
-	පොළී ගෙවීම්	8	-	-	
56,265	වෙනත් පුනරාවර්තන වියදම්	9	56,265	-	
350,880,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**306,090,566**	**298,137,509**	
	මූලධන වියදම්				
65,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	10	18,883,440	13,681,599	
116,800,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	33,051,222	19,624,114	
-	ප්‍රාග්ධන මාරු කිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,000,000	හැකියා වර්ධනය	14	596,500	596,150	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
183,300,000	**මුළු මූලධන වියදම් (උ)**		**52,531,162**	**33,901,863**	
-	තැන්පතු ගෙවීම්		5,093,111	12,452,926	ඒසිඒ-4
-	අත්තිකාරම් ගෙවීම්		13,419,042	14,878,378	ඒසිඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
-	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		18,512,152	27,331,304	
-	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		377,133,880	359,370,676	
-	2024 දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ=(ඉ-එ)		(18,961,962)	(26,729,331)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(18,961,962)	(26,729,331)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3
			(18,961,962)	(26,729,331)	

2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		තත්‍ය	
	සටහන	2024 (රු.)	2023 (රු.)
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	1,942,025,318	1,942,927.346
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	37,554,534	36,840,254
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**1,979,579,851**	**1,979,767,600**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		37,231,097	36,572,142
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,942,025,318	1,942,927,346
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම	ඒසිඒ-4	323,437	268,112
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**1,979,579,851**	**1,979,767,600**

පිටු අංක 07 සිට 49 දක්වා ඒසීඒ 1සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 50 සිට 65 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද, මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදු කර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත්, ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තා කරන ආයතනය තුළ පවතින බවත්, මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත්, ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට වරින් වර සමාලෝචන සිදු කරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : අනිල් ජාසිංහ
තනතුර : ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
දිනය : 2025.02.25

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

.....
ගණන්දීමේ නිලධාරි
නම : එච්.එස්.කේ.ජේ.බණ්ඩාර
තනතුර : ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2025.02.27

එච්.එස්.කේ.ජේ. බණ්ඩාර
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ 05.

.....
ප්‍රධාන ගණකාධිකාරි
නම : ඩී. නිලූකා රාමනායක
දිනය : 2025.02.19

ඩී. නිලූකා රාමනායක
ප්‍රධාන ගණකාධිකාරි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ 05

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තක්ෂ	
	2024 රු.	**2023** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	14,833,035	25,702,000
අග්‍රිම ලැබීම්	340,319,000	311,417,000
අත්තිකාරම් අයකර ගැනීම්	10,809,221	13,975,050
තැන්පතු ලැබීම්	5,148,436	4,909,612
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**371,109,692**	**356,003,662**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	298,767,896	291,904,206
සහනාධාර සහ මාරුකිරීම්	832,395	1,054,041
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	3,429,153	3,975,161
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	280	4,061
අත්තිකාරම් ගෙවීම්	13,217,891	14,486,385
තැන්පතු ගෙවීම්	5,093,111	12,452,926
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**321,340,726**	**323,876,781**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**49,768,967**	**32,126,881**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	49,768,967	32,126,881
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**49,768,967**	**32,126,881**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(49,768,967)**	**(32,126,881)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	**(0)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

(1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙළ කර ඇත.

(2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

(3) ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

(4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම්, එම වත්කම්, දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

(5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

(6) මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම ඇස්තමේන්තුවේ % ලෙස
20.06.02.01	වාහන	-	-	-	-
20.06.02.02	අනෙකුත්	-	-	12.34	-
20.02.01.01	රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී	-	-	-	-
20.02.01.99	රජයේ වත්කම්වලින් ලැබෙන ආදායම - කුලී - අනෙකුත් කුලී	-	-	-	-
20.02.02.99	පොළිය - අනෙකුත්	1,000	1,000	1496.16	149.61
20.03.01.00	විකුණුම් හා ගාස්තු - දෙපාර්තමේන්තුමය විකිණීම්	1,200	2,000	1805.66	90.29
20.03.02.99	විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් විවිධ	20	-	48.00	-
20.03.03.02	විකුණුම් හා ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම් - අනෙකුත්	-	-	-	-
20.03.99.00	විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම්	500	500	1976.09	395.21
20.05.99.00	වර්තන පැවරීම්, ජාතික ලොතරැයි මණ්ඩලය හා අනෙකුත් පැවරුම්	-	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	රු.348,000,000.00	රු.350,880,000.00	රු.306,090,566.00	87,24
ප්‍රාග්ධන	රු.181,300,000.00	රු.183,300,000.00	රු.52,531,1623.00	28.97

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
01.	ජනමාධ්‍ය අමාත්‍යාංශය	වරිපනම් බද්ධ ගෙවීමට	-	882,792.00	882,792,.00	100
		ඔවුන්ගේ බදු අංශය දෙපාර්තමේන්තු ගොඩනැලිල්ලේ පවත්වාගෙන යාම සඳහා විදුලි බිලෙන් 3%ක් ගෙවීමට	-	288,000.00	198,439.39	69
02.	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	ඔවුන්ගේ මුද්‍රණ අංශය දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ පවත්වාගෙන යාම සඳහා විදුලි බිලෙන් 25%ක් ගෙවීමට	-	1,800,000.00	1,653,661.67	91.87
03.	මැතිවරණ කොමිසන් සභාව	ජනාධිපතිවරණ රාජකාරි සඳහා ගෙවීම් කිරීම	-	9,650.00	9,650.00	100
			-	**2,980,442.00**	**1,861,751.06**	**62.46**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	**304,328,182.26**	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	**402,129,694.66**	-	-
9153	ඉඩම්	-	**1,227,750,000.00**	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	**4,817,440.80**	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	**3,000,000.00**	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } සීඒඑම්/ඒ/ඩීඅයි/එෆ්ඒ/2024/14

ඔබේ අංකය உ ஙகது இல. Your No. }

දිනය திகதி Date } 2025 මැයි 21 දින

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
26 MAY 2025
මුද්‍රල් අංශය

Department of Government Information
Director General
22 MAY 2025

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ශීර්ෂය - 210 , රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ මුල් පිටපත (සිංහල , ඉංග්‍රීසි , දෙමළ) මේ සමග එවා ඇත.

ජී.එච්.අයි චින්ද්‍යා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය எனது இல. My No. } සිජ්එම/ඒ/ඩිඅයි/එෆ්ජ්/2024/14
මගේ අංකය உமது இல. Your No. }
දිනය திகதி Date } 2025මැයි31දින

ගණන් දීමේ නිලධාරි

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වා ගණනය කළ මතය

ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙතඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූල ධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වා ගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු පදනම්ව මාගේ මතය තත්ත්වා ගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී. ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරී ගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්. වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක්

නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 මූල්‍ය නොවන වත්කම්

(i) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පිහිටි අක්කර 2 රූඩ් 2 පර්චස් 9.25ක භූමියේ වටිනාකම රු. 1,227,750,000 ලෙස තක්සේරු කර 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර ඇතත් එහි අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. ඉඩමේ වටිනාකම මුළු වත්කම් වලින් සියයට 63 ක් නියෝජනය වේ.

(ii) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම් යටතේ කෙරීගෙන යන වැඩ ලෙස රු.4,832,668 ක් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන ඒමේ දී රු.3,000,000 ක් ලෙස දක්වා තිබීමෙන් රු.1,832,668ක වෙනසක් නිරීක්ෂණය විය.

(iii) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අයත්ව තිබූ රු.4,000,000ක වටිනාකමින් යුතු නීත්‍යානුකූලව තැපැල් දෙපාර්තමේන්තුවට පවරා ගත් බව දක්වා තිබූ අතර මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ සහතික අනුවද අයිතිය තැපැල් දෙපාර්තමේන්තුව වෙතපැවරී ඇති බව සනාථ වූ නමුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල මෙම වාහන වල වටිනාකම ඇතුළත් කර තිබුණි. නිත්‍යානුකූල අයිතිය දෙපාර්තමේන්තුව සතු නොවන වාහන දෙකක් දෙපාර්තමේන්තුවේ මූල්‍ය නොවන වත්කම යටතේ දැක්වීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම්හි අගය එම වටිනාකමින් ඉහළ ගොස් තිබුණි.

(iv) 1999 වර්ෂයේ දී ප්‍රංශ ණය ආධාර යටතේ මිලදී ගෙන තාක්ෂණික ක්‍රම වේදයන් යල්පැනීම හේතුවෙන් භාවිතයට නොගෙන නිශ්කාර්යව පවතින අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොමැති Debri වර්ණ රසායනාගාර යන්ත්‍රය රු.12,000,000 ක වටිනාකමට මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති අතර සුන්බුන් අගය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට මේ වන තෙක් කටයුතු කර නොතිබුණි.

1.5.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා ගැනීම සිදු නොවන බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
ඇප ලේඛනය	මුදල් රෙගුලාසි 898 (1)	යාවත්කාලීන කර නොතිබුණි
හානි පාඩු ලේඛනය	මුදල් රෙගුලාසි 110	යාවත්කාලීන කර නොතිබුණි
බැරකම් පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 214	යාවත්කාලීන කර නොතිබුණි
වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය	මුදල් රෙගුලාසි 1647 (9)	පවත්වා ගෙන ගොස් නොතිබුණි

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තා

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

i) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

විගණන නිරීක්ෂණය (කෙටියෙන්)	**මෙම වාර්තාවේ ඡේදයට යොමුව**
මූල්‍ය නොවන වත්කම් වලට අදාළව 2023 වර්ෂයේ අවසාන ශේෂය හා 2024 වර්ෂයේ ආරම්භක ශේෂ නොගැළපුණි.	1.5.1(ii)

ii) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.2.2. (අ)	දේපළ පිරිවැය හා උපකරණ නිවැරදිව හඳුනාගත යුතුය	1.5.1 (iv)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

3.1.1 දෙපාර්තමේන්තුව සඳහා රු.183,300,000 ක මුල ධන වියදම් සඳහා ශුද්ධ මුදල් ප්‍රතිපාදනයක් පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.52,531,163 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව මුල ධන වියදමෙන් සියයට 71ක් ඉතිරි වී තිබුණි.

3.1.2 ප්‍රතිපාදන මාරු කිරීම්

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, තම දෙපාර්තමේන්තුවට අදාළ කෙටුම්පත් ඇස්තමේන්තු, මුදල් රෙගුලාසි වලට අනුකූලව පිළියෙල කරන බවට වග බලා ගැනීම ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා තිබූ සමස්ත පුනරාවර්ථන වැය විෂයයන් 22 කින් පුනරාවර්තන වැය විෂයයන් 08 කට සලසා තිබුණු රු. 26,534,060 ක ප්‍රතිපාදන වෙනත් පුනරාවර්ථන වැය විෂයයන් 05 ක් සහ මූල ධන වැය විෂයයක් වෙත මාරු කර තිබූ බැවින් මුදල් රෙගුලාසිවල අවශ්‍යතා සපුරාලන පරිදි කටයුතු කරමින් තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

3.2 බැරකම් හා බැඳීම් වලට එළඹීම

i) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව නිරවුල් නොකළ බැඳීම් හා බැරකම රු.9.484,680 ක් වූ අතර බැරකම් ලේඛනයේ බැඳීම් හා බැරකම් රු.10,510,212 ක් වූයෙන් රු.1,025, 532 ක වෙනසක් නිරීක්ෂණය විය.

ii) මු.රෙ. 94 (i) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතුය. එසේම ඒ වෙනුවෙන් දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටෙක මුදල් වර්ෂයේ ප්‍රතිපාදන නෙඉක්ම විය යුතු වුවත් 2024 වර්ෂයේ දී පුනරාවර්තන වැය විෂයයන් දෙකක් සඳහා රු. 1,041,633 ක් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළඹ තිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති රීති රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි	
(අ) මු.රෙ. 104	දෙපාර්තමේන්තුවට අයත් වාහන 02 ක් 2024 වර්ෂය තුළදී අනතුරකට ලක්වී තිබූ අතර මෙම අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ) මු.රෙ. 802 (01)	වාහන නිශ්කාර්යව නොපවතින බවට ආයතන ප්‍රධානියා විසින් වගබලා ගැනීමට පියවර ගත යුතු වුවද දෙපාර්තමේන්තුව සතු වාහනයක් 2023 වර්ෂයේ සිට විගණිත වාර්තාවේ දින දක්වා නිශ්කාර්යට පැවතුණි.
(ii) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 2/2020	වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර සභාගත කිරීම සඳහා නියමිතවිධි විධාන යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්**,** දෙපාර්තමේන්තුවේ 2019, 2020 හා 2021 වර්ෂ වලට අදාළ වාර්ෂික කාර්ය සාධන වාර්තා 2023 ජූලි 26 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණු අතර 2022 වර්ෂයට අදාළ වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2025 මාර්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි.

3.4 අත්තිකාරම්

සේවය හැර ගොස් ඇති නිලධාරියකුගෙන් අය විය යුතු වර්ෂ 20 ඉක්ම වූ රු.123,475 ක ණය ශේෂය 2025 පෙබරවාරි 28 දින වන විටත් අය කරගෙන නොතිබුණි.

3.5 අවධිමත් ගණුදෙනු

1) ආයතනයේ පුස්තකාල කළමනා කරණ පද්ධතිය**,** මානව සම්පත් කළමනා කරණ තොරතුරු පද්ධතිය**,** වැඩ ප්‍රවාහ සහ තැපැල් කළමනා කරණ පද්ධතිය **(**Work Flow and Postal management System) ස්ථාපිත කිරීම සඳහා රු. 1, 633,781 ක් වැය කර තිබූ අතර සෘජු කොන්ත්‍රාත් පදනම මත ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් ඉහත කාර්යය ඉටු කරගෙන තිබුණි. අදාළ පද්ධතීන් ප්‍රායෝගිකව නිවාඩු සහ බැහැර යෑම**,** අතිකාල සහ ගමන් වියදම් ගෙවීම වැනි කටයුතු සඳහා යොදා ගනු ලබන අකාරය පිළිබඳව නිශ්චිතව හඳුනා ගෙන නොතිබුණි. මේ සම්බන්ධව අංක DGI/DM/DIT/HRMS හා 2024 ඔක්තෝබර් 07 දිනැති රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් තාක්ෂණික කමිටුවක් පත් කර තිබුණ ද එම කමිටුව සුදුසුකම් සහ පළපුරුද්ද සහිත නිළධාරීන්ගෙන් සමන්විත නොවූ බව නිරීක්ෂණය විය.

අ) ඉහත කමිටුවෙන් එක් නිලධාරියෙකු අහෝසි කරන ලද ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයෙන් දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කරන ලද මාධ්‍ය විමර්ශන සහකාර යන ද්විතික මට්ටමේ (තාක්ෂණික නොවන) තනතුරක් දැරූ නිලධාරියෙක් විය. එම නිලධාරියාව දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට අන්තර් ග්‍රහණය කිරීමක් සිදුව නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර ඩිජිටල් යටිතල පහසුකම් ඒකකයේ තෘතීය මට්ටමේ තනතුරක් වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික නිලධාරි තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා 2023 පෙබරවාරි 10 දින සිට තාවකාලිකව පත් කර තිබුණි.

ආ) ඉහත කාර්ය ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමග මේ දක්වා විධිමත් ගිවිසුමකට එළඹ නොතිබූ නමුත් අදාළ කාර්යයන් ප්‍රශස්ත අයුරින් සිදු වූ බවට කිසිදු සනාථ කර ගැනීමකින් තොරව මුළු ඉන්වොයිස් වටිනාකම් සඳහාම චෙක්පත් 02ක් 2024 දෙසැම්බර් 30 දිනැතිව පිළියෙල කර අධ්‍යක්ෂ (පාලන) හාරයේ මෙම වාර්තාවේ දින දක්වාම රඳවාගෙන තිබුණි.

ii) දෙපාර්තමේන්තුවේ මාධ්‍ය සාකච්ඡා සහ අනෙකුත් රැස්වීම් පැවැත්වීමේ දී සූම් **(**ZOOM) තාක්ෂණය භාවිතා කර ඇති අතර එම තාක්ෂණික පහසුකම පෞද්ගලික ආයතනයක් හරහා ලබා ගැනීම හේතුවෙන් 2024 වර්ෂය තුළ දී එම ආයතනයට රු.1,550,000 ක් සේවා ගාස්තු ලෙස ගෙවා තිබුණි. දෙපාර්තමේන්තුව විසින් සෘජුවම එම පහසුකම ලබා ගන්නේ නම් මුළු පිරිවැය වර්ෂයකට අවම වශයෙන් රු**.**120,000ක් පමණ වන බැවින් දෙපාර්තමේන්තුවට වර්ෂයකට රු.1,430,000 ක මුදලක් අතිරේකව දැරීමට සිදුව ඇති බව නිරීක්ෂණය විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 **කාර්ය සාධනය**

4.1.1 **කාර්යයන් ඉටු නොකිරීම**

(i) ක්‍රියාකාරී සැලැස්මට අනුව කිසිදු භෞතික ප්‍රගතියක් නොමැති වැඩසටහන් 12 ක් පැවති අතර ඉන් රු. මිලියන 41.33 ක් ප්‍රතිපාදන සලසා තිබූ වැඩ සටහන් 08 ක් පැවතිය ද එම මූල්‍යමය ප්‍රතිපාදන වර්ෂය තුළ අදාල වැඩසටහන් සඳහා යොදවා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයට අදාලව පිලියෙළ කල ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂයේ කාර්ය සාධන ප්‍රගතිය සැලකීමේදී සියයට 50 ට වඩා අඩු ප්‍රගතියක් පෙන්නුම් කරන වැඩසටහන් 05 ක් පැවතුණි.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

ආයතනයේ අභ්‍යන්තර සන්නිවේදන කටයුතු සිදු කිරීමට අත්‍යවශ්‍ය වන PABX පද්ධතිය ස්ථාපිත කිරීමේ කටයුතු 2023 වර්ෂයේ ආරම්භ කර ඇති අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිම කර නොතිබුණි බව නිරීක්ෂණය විය.

4.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ **(Outcome)** ලබා නොගැනීම

2024 වර්ෂය තුළ මිල දී ගත් රු.5,103,500 වටිනාකමින් යුත් ලැප්ටොප් පරිගණක 04 ක් හා ඩෙස්ක්ටොප් පරිගණක 11ක් 2024 දෙසැම්බර් 31 දින පෞද්ගලික සමාගමකින් මිල දී ගෙන තිබූ අතර එම පරිගණක අපේක්ෂිත පිරිවිතරයන්ට අනුකූල නොවූ බැවින් 2024 දෙසැම්බර් 31 දින සිට 2025 මාර්තු 31 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

4.1.4 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව කාර්ය සාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තු ගත කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතු අතර වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතුය. දෙපාර්තමේන්තුව සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම 2024 වර්ෂය සඳහා පමණක් සකස් කළ එකක් විය.

ii) අ) සමාලෝචිත වර්ෂය සඳහා ලැප්ටොප් පරිගණක 15 ක් පමණක් ලබා ගැනීමේ අවශ්‍යතාව දක්වමින් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබූ නමුත් පසුව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලීය අවශ්‍යතා ලෙස දක්වමින් රු.9,877,779 ක වටිනාකමින් යුතු ලැප්ටොප් පරිගණක 17 ක් හා ඩෙස්ක්ටොප් පරිගණක 12 ක් මිලට ගෙන තිබුණි.

ආ) අංක 01/2024 හා 2024 ජනවාරි 10 දිනැති ජාතික අය වැය චක්‍රලේඛ ප්‍රකාරව හදිසි මිල දී ගැනීම් සිදු නොවන පරිදි අවශ්‍යතා කලින් හඳුනා ගැනීම හා අනුමත ප්‍රසම්පාදන සැලසුම් ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදයන් අවම වන පරිදි ක්‍රියාත්මක කළ යුතු වුවත් පරිගණක මිලට ගැනීමේ අවශ්‍යතාව සම්බන්ධ තීරණ ගැනීම සිදු කර ඇත්තේ 2024 නොවැම්බර් මස 26 වැනි දින වන අතර ආයතනික අවශ්‍යතා කලින් තීරණය කර ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කිරීමට ක්‍රියා කර නොතිබුණි. 2024 වර්ෂයේ අදාළ සංශෝධන ඇතුළත් කරමින් සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව ඇප තැබිය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරීන් සිව්දෙනෙකු ඇප තබා නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.4 අනාර්ථික ගනුදෙනු

i) උතුරු දුම්රිය මාර්ගය නවීකරණය පිළිබඳව වාර්තා වැඩසටහනක් රු.239,481 ක් වැයකර නිෂ්පාදනය කර තිබුණු නමුත් මේ දක්වා කිසිදු මාධ්‍ය ජාලයක විකාශනය කර නොතිබුණි. අදාල වැඩසටහන විනාඩි 05කට නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද විනාඩි 30 කට නිෂ්පාදනය කර තිබුණි.

ii) ශ්‍රී ලංකා රජය සහ නිල ණය දෙන්නන්ගේ කමිටුව සමග ප්‍රංශයේ පැරිස් නුවර 2024 ජුනි මස 26 සිට 29 දක්වා වන කාල සීමාව තුළ දී අත්සන් කෙරුණු ගිවිසුමේ මාධ්‍ය ආවරණ කටයුතු සිදු කිරීම පිණිස විදේශගත වීම සඳහා නියමිත දිනට විසා ලබා නොගැනීම හේතුවෙන් ගුවන් ගමන් බලපත්‍රවල දිනයන් කල් දැමීමට සිදුව ඇති නිසා ඒ වෙනුවෙන් රු.169,200 ක දඩ මුදලක් ගෙවීමට සිදුව තිබූ අතර මාධ්‍ය කණ්ඩායම ප්‍රංශයට යන විටත් අදාළ ගිවිසුම අත්සන් කර අවසන් බව නිරීක්ෂණය වූ බැවින් මේ සඳහා දැරූ රු.1,804,421 ක මුදල නිශ්කාර්ය වියදමක් බව විගණනයේ දී නිරීක්ෂණය විය

4.5 කළමනා කරණ දුර්වලතා

i) දෙසතිය සහරාවේ 2024 වර්ෂයේ මුද්‍රණ හා කතෘ පිරිවැය රු. 3,299,994 ක් වූ අතර විකුණුම් ආදායම රු. 772,339 ක් විය. ඒ අනුව රු. 2,527,655 ක අලාභයක් ලබා තිබුණි. අලාභය අවම වන පරිදි පිරිවැය ආවරණය කරගත හැකි ආකාරයේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු අතර මුද්‍රණය කරන කලාප වශයෙන් විකුණුම් ආදායම වෙන්ව හඳුනා ගැනීමට වැඩ පිළිවෙලක්ද සකස් කර නොතිබුණි.

ii) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නව ශ්‍රවණාගාරයට විදුලි ජනන යන්ත්‍රයක් කුලී පදනම මත ලබා ගැනීම 2022 වර්ෂයේ සිට සිදුකර තිබූ අතර ඒ සඳහා 2022 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා රු.4,455,270 ක කුලී වියදමක් දරා තිබුණි. ජාතික වශයෙන් වැදගත් වන්නා වූ රජයේ ප්‍රතිපත්ති සැලසුම් හා සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කිරීම අඛණ්ඩව සිදු කිරීම සඳහා ආයතනය තුළම නිරන්තරවම විදුලි ජනන යන්ත්‍රයක් පැවතීම අත්‍යාවශ්‍ය බව නිරීක්ෂණය විය. 2024 වර්ෂයේ යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීමට රු.100,300,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද 2024 විදුලි ජනන යන්ත්‍රයක අවශ්‍යතාව ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කිරීමට ක්‍රියාකර නොතිබුණි.

iii) පෞද්ගලික සමාගමකින් මිලට ගත් පරිගණක 15 වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා අංක 312329 හා 2024 දෙසැම්බර් 29 දිනැති චෙක්පත සකස් කර 2025 මාර්තු 31 දින දක්වා අදාළ පාර්ශවය වෙත භාර නොදී ගිණුම් අංශය තුළ රඳවා ගෙන තිබුණි. 2024 දෙසැම්බර් 31 දින දෙපාර්තමේන්තු ගබඩාවට අදාළ පරිගණක ලැබී තිබූ බව ප්‍රසම්පාදන ලිපිගොනුව අනුව නිරීක්ෂණය වූ අතර අදාළ පරිගණක ගබඩා වෙත ලැබීමට පෙර අදාළ චෙක්පත ලියා ඇති බව නිරීක්ෂණය විය. අදාළ පරිගණකවල අඩුපාඩු පවතින බව අංශ ප්‍රධානි, ඩිජිටල් හා තොරතුරු තාක්ෂණ ඒකකය විසින් 2024 දෙසැම්බර් 31 දින ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරි වෙත ලිඛිතව දන්වා ඇතත් ඒ බව මිල දී ගත් සමාගමේ විකුණුම් කළමනාකරු වෙත ලිඛිතව දැනුම් දීම සිදු කර තිබුණේ 2025 මාර්තු 20 දින දීය.

5 තිරසාර සංවර්ධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

2017 අංක 19 දරණ ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනතෙහි භාවිතයට ගැනෙන නියෝග අනුව ආයතනය තිරසර අරමුණු හඳුනා ගැනීමේ දී අරමුණු 06 ක් හඳුනාගෙන තිබුණ ද ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග ලෙස ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම හා කලින් කලට රජය විසින් විවිධ චක්‍ර ලේඛ මගින් ප්‍රතිපාදන සීමා කිරීම දක්වා ඇතත් ලැබෙන ප්‍රතිපාදන කාර්යක්ෂමව ඵලදායීව

යොදාගෙන ආයතනයේ විෂය පථයට හා මූල්‍යමය හැකියාවට ගැළපෙන පරිදි තිරසර අරමුණු ස්ථාපිත කිරීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

6. අභ්‍යන්තර විගණනය

2024 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ක්ෂේත්‍ර 12කට අදාලව අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට සැලසුම් කර තිබුණ ද එයින් ක්ෂේත්‍ර 07 ක් සම්බන්ධව අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

7. මානව සම්පත් කළමනා කරණයයි

(i) ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යභාරය විධිමත් රාජකාරී පැවරුම් ලැයිස්තුවක් මගින් හෝ පනතක් / ගැසට් නිවේදනයක් මඟින් බලාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2022 වසරේ සංවර්ධන නිලධාරී සේවයේ නව පත්වීම් ලබා දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටින සංවර්ධන නිලධාරීන් 63 දෙනෙක්ද ඊට අමතරව ප්‍රවෘත්ති නිලධාරී තනතුරු 24ක්, මාධ්‍ය විමර්ශන සහකාර තනතුරු 11ක්, වෙබ් ලේඛක තනතුරු 04ක්ද ඇතුළුව තනතුරු 102ක් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොකර ආයතනයේ සේවය කරන බව නිරීක්ෂණය විය.

7.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුව තුළ වර්ෂ 5 ඉක්මවා සේවයේ නියුතු 68 දෙනාගෙන් 13 දෙනෙකු වසර 11ත් 15ත් අතර වර්ෂ ගණනකුත්, 30 දෙනෙකු අවුරුදු 15කට වැඩි වර්ෂ ගණනකුත් දෙපාර්තමේන්තුවේ සේවය කර ඇති බව නිරීක්ෂණය විය.

ජී.එච්.අයි.විත්ධ්‍යා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (2024 ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම්		
		100%- 90%	89%-51%	50% - 10%
ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය				
කැබිනට් තීරණ දැනුම් දීමේ ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය කිරීම			85%	
කැබිනට් මාධ්‍ය ප්‍රකාශය සජීවී පටිගත කිරීම, ප්‍රවාහය හා ප්‍රචාරය කිරීම		100%		
රජයේ විශේෂිත වැඩසටහන් පිළිබඳව ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය		100%		
මාධ්‍ය ආවරණ සිදු කිරීම				
ප්‍රචාරණ ඒකකය මඟින් වෙනත් ආයතන විසින් පවත්වන මාධ්‍ය සාකච්ඡා/ මාධ්‍ය ආවරණ සම්බන්ධීකරණය		100%		
වීඩියෝ කැමරා ඒකකය මඟින් සහ ඡායාරූප ඒකකය මඟින් සිදු කරන ප්‍රවෘත්ති ආවරණ/ මාධ්‍ය ආවරණ		100%		
රජයේ සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් හා විශේෂ අවස්ථා අනුව මාධ්‍ය නිරීක්ෂණ චාරිකා සංවිධානය කිරීම		100%		
දිස්ත්‍රික් මාධ්‍ය ඒකක මඟින් සිදුකරන ප්‍රවෘත්ති ආවරණ		100%		
ජාතික හා ජාත්‍යන්තර උත්සව අවස්ථා මාධ්‍ය සම්බන්ධීකරණය හා මාධ්‍ය ආවරණය		100%		
සමාජ මාධ්‍ය යාවත්කාලීන කිරීම				
භාෂා ත්‍රිත්වයෙන් වෙබ් අඩවි යාවත්කාලීන කිරීම	www.dgi.gov.lk	100%		
	www.news.lk	100%		
DGI හා News.lk	Facebook	100%		
	X (Twitter)	100%		
	YouTube	100%		
දිස්ත්‍රික් මාධ්‍ය ඒකක	Facebook	100%		
රජයේ චිත්‍රපට අංශය	YouTube	100%		
පාසල් මාධ්‍ය සංවර්ධන ඒකකය	Facebook	100%		
	YouTube	100%		
නිෂ්පාදන කටයුතු				

වාර්තා චිත්‍රපට, සාකච්ඡාමය වැඩසටහන් හා කෙටි වීඩියෝ වැඩසටහන් නිෂ්පාදනය	100%		
රජයේ වීඩියෝ දැන්වීම් නිෂ්පාදනය	100%		
අමාත්‍ය මණ්ඩල තීරණ හා විශේෂිත මාධ්‍ය සාකච්ඡා සංඥා භාෂාවෙන් සහ දමිළ භාෂාවෙන් නිෂ්පාදනය	100%		
ප්‍රකාශන පළ කිරීම හා වාර්තා සකස් කිරීම			
දෙසතිය සඟරාව පළ කිරීම	100%		
ජාතික මාධ්‍ය සංකථන කෘතියේ 3 වන හා 4 වන වෙළුම් ප්‍රකාශයට පත් කිරීම	100%		
දිනපතා ශ්‍රව්‍ය,දෘශ්‍ය, මුද්‍රිත මාධ්‍ය හා හා සමාජ මාධ්‍ය ඇසුරෙන් විශ්ලේෂණ වාර්තා සිංහල සහ ඉංග්‍රීසී මාධ්‍යයෙන් සකස් කිරීම	98%		
ජනමාධ්‍ය ප්‍රවර්ධනය හා පුහුණු සංවිධානය			
අන්තර්ජාතික මාධ්‍ය සම්මන්ත්‍රණ (Media Symposium) සංවිධානය කිරීම	100%		
පාසල් සිසුන් සහ ගුරුවරුන් සඳහා දේශන පැවැත්වීම	100%		
පොත් කට්ටල සහ බිත්ති පුවත්පත් 50 බැගින් පාසල්වලට බෙදා හැරීම		56%	
පාසල් සිසුන් සඳහා කෙටි කතා හා කෙටි චිත්‍රපට තරඟ සංවිධානය කිරීම	100%		
ජනමාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම			49%
පාසල් ගුරුවරුන් 250ක් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම	91%		
පාසල් මාධ්‍ය සමාජ සඳහා E-NewsPaper ප්‍රකාශයට පත් කිරීම			33%
මාධ්‍යවේදීන් සඳහා වැඩමුළු සංවිධානය කිරීම.	100%		
පොලිස් සහ ත්‍රිවිධ හමුදාවල මාධ්‍යට සම්බන්ධ නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම	100%		
විශ්ව විද්‍යාල ශිෂ්‍ය පර්යේෂණ නිබන්ධන සඳහා, පුහුණුව ලබන විශ්ව විද්‍යාල සිසුන් සහ ක්ෂේත්‍රයට පැමිණෙන පාසල් සිසුන් සඳහා අවශ්‍ය නිදර්ශන සහ ප්‍රායෝගික පුහුණු සැපයීම	100%		
දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.	100%		
ඡායාරූප චිත්‍රපට සංරක්ෂණය			
ඡායාරූප පුස්තකාලයේ පැරණි ඡායාරූප නෙගටිව් ස්කෑන් කිරීම (ඡායාරූප සංරක්ෂණය) හා ස්ථිර උපස්ථ වෙත සියලුම ඡායාරූප සුරැකීම	100%		
ඩිජිටල් ඡායාරූප ආවරණ ඡායාරූප පුස්තකාලයේ ගබඩා කිරීම	100%		
රජයේ චිත්‍රපට අංශය සතු වාර්තා සහ ප්‍රවෘත්ති චිත්‍රපට සංරක්ෂණයට අදාළ චිත්‍රපට කෝණ පිරිසිදු කිරීම සහ ඩිජිටල් මාධ්‍ය බවට පරිවර්තනය කිරීම	100%		

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/ අරමුණ	ඉලක්ක (ගෝලීය ඉලක්කය)	සාක්ෂාත් කර ගැනීම සඳහා වන දර්ශක	වර්තමානය වන විට සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
නිරෝගී ජීවිතයක් තහවුරු කිරීම හා සියලු දෙනාට, සෑම වයසකදීම යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම **(SDG 03)**	නිරෝගී බව සහ යහපැවැත්ම පවත්වා ගැනීම	"ප්‍රවේණිගත ජාන රෝග" පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා GENE CLINIC සාකච්ඡාමය වැඩසටහන් නිෂ්පාදනය	-	-	100%
		අක්ෂි රෝග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා "DGI Health Talk" සාකච්ඡාමය වැඩසටහන් නිෂ්පාදනය			
සමාන හා අන්තර්ග්‍රහණීය වූ අධ්‍යාපනයක් ලැබීම තහවුරු කිරීම හා සැමට ජීවිත කාලය පුරා අධ්‍යාපනය ලැබීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම **(SDG 04)**	විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් සඳහා ආධුනිකත්ව පුහුණු අවස්ථා ලබා දීම.	වසර තුළදී ආධුනිකත්ව පුහුණු අවස්ථා 35 ක් ලබා දීම	-	-	**100%**
	දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පුහුණු අවස්ථා ලබා දීම.	එක් නිලධාරියෙකුට අවම පැය 12ක් වත් වන පරිදි පුහුණු අවස්ථා ලබා දීම	-	-	**89%**
ස්ත්‍රී පුරුෂ සමාජභාවය අත්කර ගැනීම සහ කාන්තාවන් හා ගැහැණු ළමයින් බලගැන්වීම **(SDG 05)**	අනාගත මාධ්‍ය වෘත්තීන්හි කාන්තා දායකත්වය ඉහළ නැංවීම සඳහා පාසල් මාධ්‍ය සමාජ තුළ ශිෂ්‍යාවන් සවිබල ගැන්වීම	කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ වාර්තා වැඩසටහන නිෂ්පාදනය	-	-	**80%**

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ:

1. ප්‍රවේණිගත ජාන රෝග පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා නිෂ්පාදිත GENE CLINIC සාකච්ඡාමය වැඩසටහන් නිෂ්පාදනය.
2. අක්ෂි රෝග පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා නිෂ්පාදිත “DGI Health Talk” සාකච්ඡාමය වැඩසටහන් නිෂ්පාදනය.
3. කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ වාර්තා වැඩසටහන නිෂ්පාදනය.
4. තොරතුරු දැන ගැනීමේ පනත ප්‍රායෝගිකව යොදගත් අවස්ථාවන් පිළිබඳ වාර්තා වැඩසටහන නිෂ්පාදනය.
5. දෙසතිය සඟරාව තුළින් යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම ලිපි පළ කිරීම.
    - යළි හිස ඔසවන සරම්ප - පෙබරවාරි කලාපය (පිටුව 30-31)
    - උසට නොසරි තරබර - අප්‍රේල් කලාපය (පිටුව 11-12)
    - නිරෝගී ක්‍රියාශීලී දරු පරපුරක් -මැයි කලාපය - කවරේ කතාව (පිටුව 19-28)
    - කෘතිම බුද්ධිය සොයා කොරියානු දේශයට - අගෝස්තු කලාපය (පිටුව 9-10)
    - සමබර ආහාර වේලක් ගෙනෙයි සුව බර දිවියක් - ඔක්තෝබර් කලාපය (පිටුව 9-11)
    - M පොක්ස් වෛරසය - ඔක්තෝබර් කලාපය (පිටුව 7-8)

❖ **අභියෝග:**

1. තිරසර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීම සඳහා පෞද්ගලික මාධ්‍ය ආයතන දායක කර ගැනීම.

2. තාක්ෂණයේ ප්‍රගමනයත් සමඟ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නව තාක්ෂණයන් යොදා ගැනීම.

3. අන්තර්ජාතික මට්ටමේ මාධ්‍ය වෘත්තිකයන් බිහි කිරීම.

4. රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශය සමඟ ගුණාත්මක මාධ්‍ය සංස්කෘතියක් බිහි කිරීම.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	19	07	12	0
තෘතීයික	16	02	14	0
ද්විතියික	243	150	93	0
ප්‍රාථමික	52	40	14	0
කොන්ත්‍රාත්	13	-	13	0
එකතුව	343	199	144	0

* 2023.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූව ද ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයෙන් පැමිණි නිලධාරීන් 39 ක් සහ 2022 සංවර්ධන නිලධාරී පත්වීම් ලද නිලධාරීන් 63 ක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවාවන්හි නිරත වේ.

අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ නිලධාරීන්

ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයෙන් පැමිණි නිලධාරීන්	39
2022 සංවර්ධන නිලධාරී පත්වීම් ලද නිලධාරීන්	63
එකතුව	102

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපෑම.

තෘතීයික මට්ටමේ සහ ද්විතියික මට්ටමේ මානව සම්පත් හිඟය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය උදෙසා සෘජුවම බලපා ඇත. විශේෂයෙන් තාක්ෂණික කාර්යභාරය ඉටු කරන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම හේතුවෙන් දෛනික රාජකාරී කටයුතු ඉටු කර ගැනීමේදී අපහසුතාවයක් පවතී. ඒ සඳහා දෙපාර්තමේන්තුගත තනතුරුවල සේවයේ යෙදී සිටි දැනුම සහ කුසලතාවයෙන් යුතු නිලධාරීන් විශ්‍රාම යාම ප්‍රධානම හේතුව වී ඇත. නවක නිලධාරීන්ට එම පුහුණුව ලබා දීමට විශාල කාලයක් ගත වනු ඇත. එසේම එම තනතුරුවල පුරප්පාඩු සඳහා උසස්වීම් ලබා දීමට ඇති බාධා හේතුවෙන් ද මේවන විට විවිධ මට්ටම්වල තනතුරු සඳහා නිලධාරී හිඟයක් ඇති වී තිබේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය /විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
Digital Maketing	12	2024 පෙබරවාරි 21 සහ 22	රු.156,000.00	-	දේශීය	සමාජ මාධ්‍ය දියුණු කිරීම
නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම	01	2024 පෙබරවාරි 29 මාර්තු 01	රු. 13,000.00	-	දේශීය	නිවාඩු විෂය පිළිබඳ දැනුම වර්ධනය
පුස්තකාල සම්පත් ඩිජිටල් කරණය සහ එහි තාක්ෂණික ප්‍රවණතා පිළිබඳ පාඨමාලාව	02	2024 මාර්තු 11	රු.5,000.00	-	දේශීය	මුද්‍රිත සම්පත් ඩිජිටල් කරණය කර සංරක්ෂණය කිරීම
Conducting Training of Trainers Program for Ministry of Mass Media and its Affiliated Government Media Institutions	04	2024 අප්‍රේල් 03 සහ 04	නොමිලේ	-	දේශීය	වැඩසටහන් ඉදිරිපත් කිරීම පිළිබඳ දැනුම වර්ධනය
ලංසු ලියවිලි සැකසීම	02	2024 අප්‍රේල් 02	රු. 27,000.00	-	දේශීය	ප්‍රසම්පාදන දැනුම
කොන්ත්‍රාත් පරිපාලන, ගෙවීම් කිරීමේ ක්‍රියා පටිපටිය සහ කොන්ත්‍රාත් ලිපිගොනු නඩත්තුව	02	2024 අප්‍රේල් 04	රු.7000.00	-	දේශීය	කොන්ත්‍රාත් පරිපාලන කටයුතු දැනුම වර්ධනය

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අයතනය මඟින් පවත්වනු ලැබූ මාර්ග පාඨමාලා	60	2024 මාර්තු 22 සිට 2024 මාර්තු 28 දක්වා	නොමිලේ	-	දේශීය	කාර්යාල හා මුදල් රෙගුලාසි දැනුම වර්ධනය
පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායි ආකාරයෙන් පවත්වාගෙන යාම පිළිබඳ පුහුණු පාඨමාලාව	06	2024 ජූනි 24	රු.30,000.00	-	දේශීය	පෞද්ගලික ලිපි ගොනු කටයුතු වල ඵලදායිතා දියුණුව
තෙවන අන්තර්ජාතික ජාතික පුස්තකාල පර්යේෂණ සම්මන්ත්‍රණය - 2024	01	2024 සැප්තැම්බර් 06	රු2500.00	-	දේශීය	පුස්තකාලය කළමනාකරණය පිළිබඳ දැනුම
ආයතනික කළමනාකරණය පුහුණු පාඨමාලාව	04	2024 අගෝස්තු 29	රු.48,000.00	-	දේශීය	ලිපිගොනු කළමනාකරණය පිළිබඳ දැනුම
වියදම් හා ගෙවීම් පටිපාටිය - FR	04	2024 සැප්තැම්බර් 12	රු. 48,000.00	-	දේශීය	වියදම් හා ගෙවීම පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීම
බදු නීතිය හා ආදයම් බදු වගකීම ගණනය කිරීම	04	2024 නොවැම්බර් 05	රු.48,000.00	-	දේශීය	බදු ගණනය පිලිබඳ දනුම
කාර්යාල ක්‍රම පොදු පුහුණු පාඨමාලාව	89	2024 නොවැම්බර් 11	රු.80,000.00	-	දේශීය	කාර්යාල කටයුතු පිළිබඳ සාමාන්‍ය දැනුම
වාර්ෂික ගබඩා සමීක්ෂණය හා පාවිච්චි නොකළ භාණ්ඩ අපහරණය	11	2024 නොවැම්බර් 26	රු.132,000.00	-	දේශීය	ගබඩා සමීක්ෂණය පිළිබඳ දැනුම

6.4 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායකත්වය

රාජ්‍ය සේවයට නවක පත්වීම් ලද නිලධාරීන් අනුයුක්ත කර සිටින අංශවලට හා පවරනු ලබන රාජකාරීවලට අදාළව බාහිර ආයතන මඟින් නිසි පුහුණුවක් ලබා දීම තුළින් තම රාජකාරී නිවැරදිව, ක්‍රමානුකූලව හා කාර්යක්ෂමතාවයෙන් යුතුව ඉටු කිරීමට හැකියාව ලැබෙනු ඇත. එසේම කාර්ය මණ්ඩල අභිප්‍රේරණයක් ළඟා කර ගැනීම මෙමඟින් අපේක්ෂිතය.

තවද මෙම පුහුණු පාඨමාලා තුළින් නිලධාරීන්ට රාජකාරී පරිසරයේ ඒකාකාරී බවින් මිදීමට, නව දැනුම උකහා ගැනීමට හා ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කර ගැනීමට අවස්ථාව ලැබේ.

නිලධාරීන් පුහුණු පාඨමාලාවන්ට යොමු කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නැංවීමට හැකියාව ලැබේ.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.6	වෙනත්	අදාළ නොවේ	-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-

3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
4.6	කාර්තු වාර්තා නියමිත දිනට මහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-

5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ	-	-
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ	තොරතුරු සොයා ගැනීමට කාලයක් හා ශ්‍රමයක් කැපකිරීමට සිදුවීම.	තොරතුරු පද්ධතිය ස්ථාපිත කරගැනීම.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-

7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	-	-
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ	-	-

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු කර ඇති නමුත් නියමිත කාලය තුළ ඉදිරිපත් කිරීමට නොහැකි විය.	ඉදිරි භාණ්ඩ සමීක්ෂණ කටයුතු ඉක්මනින් අවසන් කර නියමිත කාලය තුල වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමට නියමිතයි.
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල නොවේ	අතිරික්තතා පිළිබඳ කමිටු වාර්තාව අනුව ක්‍රියාමාර්ග ගත් අතර ඌනතා පිළිබඳ විමර්ශන කමිටු වාර්තාව මෙතෙක් ලැබී නොමැත.	විමර්ශන කමිටු වාර්තාව ලද පසු නිර්දේශිත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ	නියමිත කාලය තුළ ඉදිරිපත් කිරීමට නොහැක.	ඉදිරි භාණ්ඩ සමීක්ෂණ කටයුතු කාලය තුළ සිදු කිරීම.
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-

9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	ගර්හිත වාහන වෙනත් ආයතනයකට පවරා ඇත.	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහ ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-

10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	-	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ	-	-
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල නොවේ	ප්‍රතිපාදන ඉක්මවා වාහන නඩත්තු වවුචර් පත් ඉදිරිපත්වීම.	-

12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම්, විශ්‍රාම යාම් හා 2022.06.22 දිනැති රා.ප.ව. 14/2022 පරිදි 2023 අගෝස්තු සිට නිවාඩු ලබාගත් නිලධාරීන්ගේ මාසිකව අයවිය යුතු ණයවාරික ය නොවීම හේතුවෙන් අවම ලැබීම සීමාවට ලඟා විය නොහැකි වීම නිසා දෙපාර්තමේන්තුව මඟින් 2024.11.01 දිනැති ලිපිය මඟින් මුදල් ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදන සැලසුම් හා සංචාරක අමාත්‍යාවරයා වෙත සීමා සංශෝධනයන් සඳහා ඉල්ලීමක් කර ඇත.	
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.	-
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරිය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ශේෂ මුදල් නොපමාව පියවීම සිදු කළද වවුචර්පත්වල අඩුපාඩු හේතුවෙන් අවසන් පියවීම ප්‍රමාද වීම	ඉදිරියේදී නිලධාරීන් දැනුවත් කර නිසියාකාරව වවුචර්පත් ඉදිරිපත් කිරීම
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	-	-

15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ	-	-
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	-	-

17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම	අනුකූල වේ	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ	-	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ	-	-

19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ	-	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ	-	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල නොවේ	-	අදාළ විගණන ඡේද නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී

❖ අවසානය

රාජ්‍ය ප්‍රතිපත්ති, රජයේ සංවර්ධන ක්‍රියාදාමය ඇතුළුව ජාතික වැදගත්කමකින් යුතු කාලීන ක්‍රියාකාරකම් සහ ජනතාව වෙනුවෙන් රජය මඟින් ඉටු කරනු ලබන කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම හා කාර්යභාරය වන අතර වෙනස්වන ගෝලීය තාක්ෂණ ප්‍රවනතාවන්වලට අනුගත වෙමින් තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය කළමනාකරණය කර, නිදහස් හා වගකිව යුතු උසස් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැඟීම සඳහා අනුබල දීම හා නායකත්වය සැපයීම ද ප්‍රධාන අභිමතාර්ථයන් වේ.

මෙකී කාර්යභාරය සාක්ෂාත් කරගනු වස් එනම්, යහපත් මාධ්‍ය සමාජයක් ගොඩනැඟීම සඳහා අවශ්‍ය වන්නා වූ පසුබිම ලාංකේය සමාජය තුළ ස්ථාපිත කිරීමට උපයෝගි කර ගනු ලබන ප්‍රතිපත්ති සැකසීම, දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය පාලනය, අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමඟ රාජකාරීමය සම්බන්ධතා පවත්වාගෙන යාම ආදිය සඳහා දෙපාර්තමේන්තුව සිය කාර්යමණ්ඩලය මෙහෙයවන අතර එහිදී එකී නිලධාරීන්ට සිය වගකීම් ඉටු කර ගැනීමට අවශ්‍ය කරන දැනුම, හැකියාව හා පරිසරය සකස් කර දෙනු ලබයි.

මේ තුළ වැඩි අවධානයක් දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණු කෙරෙහි යොමු කෙරෙන අතර දෙපාර්තමේන්තුවේ සියලුම අංශ එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිසම ක්‍රියාත්මක වේ.

රජයේ සංවර්ධන පුවත් ජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීමේ භූමිකාව මෙන්ම ඒ හා ඇදුනු තවත් අරමුණු සාක්ෂාත් කර ගනු වස් ක්‍රියාත්මක රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, ඒ වෙනුවෙන් විවිධ ක්‍රියාකාරකම් සිය සැලසුම් තුළ අන්තර්ගත කර වසර මුලදී එකී සැලසුම් සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබා ගනී.

ඉන් අනතුරුව වසර පුරා එකී සැලසුම් ක්‍රියාත්මක කිරීමට අදාළ ක්‍රියාකාරකම්වල නිරත වන අතර එමඟින් සාක්ෂාත් කර ගැනීමට වෙර දරන අරමුණු මූලික වශයෙන් පහත පරිදි පෙළගැස්විය හැක.

- ප්‍රමිතිගත මාධ්‍ය සම්ප්‍රදායක් ඇති කිරීම.
- තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ සංවර්ධන වැඩසටහන් වැඩපිළිවෙල පිළිබඳව තොරතුරු මහජනතාව වෙත ගෙන යාම.
- මාධ්‍ය විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.
- යහපාලනය, සංහිඳියාව, තිරසාර සංවර්ධනය ස්ථාපිත කරමින් ප්‍රකාශනයේ හා භාෂණයේ නිදහස තහවුරු කිරීම.
- මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ කටයුතු, සංවර්ධන හා සැලසුම් ඇති කිරීම.
- ඉහත අරමුණු සාක්ෂාත් කරගනු වස්, දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වර්ග කළ හැක.

- අනෙකුත් අමාත්‍යාංශ විසින් ඉටු කරනු ලබන කාර්යයන්ට අදාළ දැනුවත් කිරීමේ වැඩසටහන් (මාධ්‍යවේදීන්, පාසල් සිසුන්, මාධ්‍ය ලේකම්වරුන් හා අනෙකුත් පාර්ශව)
- මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම (කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය සාකච්ඡාව හා වෙනත් අමාත්‍යාංශ හා ආයතන කාර්යභාරයට අදාළව)
- ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම
- මාධ්‍ය නිරීක්ෂණ චාරිකා සංවිධානය කිරීම
- සංවර්ධන වැඩසටහන් පිළිබඳ ලිපි හා ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම
- නව මාධ්‍ය යොදාගෙන සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රචාරණය ලබා දීම (FaceBook, YouTube, X (Twitter) etc….)
- දෙස් - විදෙස් මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම
- දෛනික විමර්ශන වාර්තා සකස් කිරීම හා අවශ්‍යතාවය මත අදාළ අංශ දැනුවත් කිරීම
- කාලීන වශයෙන් වැදගත් මාතෘකා හා මාධ්‍ය ක්ෂේත්‍රයේ නව ප්‍රවනතා සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම හා වාර්තා ඉදිරිපත් කිරීම.
- වාර්තා චිත්‍රපට නිෂ්පාදනය හා ප්‍රචාරය
- ජාතික උත්සව හා සංරක්ෂණය කළ යුතු අවස්ථාවන් ආවරණය හා එකී අවස්ථා ඡායාරූප ගැනීම හා සංරක්ෂණය.

රටේ උද්ගත වෙමින් තිබූ ආහාර හා ආර්ථික අර්බුදයට මුහුණදීමට ජනතාව සූදානම් කර තැබීම සඳහා රජය විසින් ක්‍රියාවට නැංවූ විවිධ වැඩසටහන් පිළිබඳව වාර්තා චිත්‍රපට / කෙටි වීඩියෝ පට / දැන්වීම් නිෂ්පාදනය කරමින් ජනතාව නිවැරදිව දැනුවත් කර තැබීම සඳහා කටයුතු කරන ලදී. ජාතික වශයෙන් වැදගත් සැමරුම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දැන්වීම්, වාර්තා චිත්‍රපට සහ ප්‍රචාරක පට නිෂ්පාදනය කරන ලදී (උදා - 76 වැනි ජාතික නිදහස් දින සැමරුම පිළිබඳව රූපවාහනී ප්‍රචාරකපට, සියවසට පියවරක් වාර්තා චිත්‍රපටය). ශ්‍රී ලංකාවේ ආර්ථිකය අර්බුදයට ලක්ව තිබූ මොහොතක අසල්වැසි හා හිතමිතුරු රාජ්‍යයන්ගෙන් ලැබුණු උදව් උපකාර හා ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව වාර්තා චිත්‍රපට මගින් ජනතාව දැනුවත් කරන ලදී. අර්බුදයට ලක්ව තිබූ සංචාරක කර්මාන්තය නැවත ඔසවා තැබීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්වලට සමගාමීව කෙටි වීඩියෝ වැඩසටහන් නිෂ්පාදනය කරමින් කටයුතු කරන ලදී. IMF ණය සහනය ලැබීම පිළිබඳව හා ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම පිළිබඳව කෙටි වාර්තා වැඩසටහන් නිෂ්පාදනය කර විකාශය කර ඇත.

මෙලෙස විවිධාකාර භූමිකා හා අරමුණු ඔස්සේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව තම දෛනික රාජකාරී කටයුතු වඩා කාර්යක්ෂමතාවයෙන් සහ රාජ්‍ය ප්‍රතිපත්ති හා අරමුණු ඉටු කර ගැනීමට මනා පිටුබලයක් වෙමින් ඉදිරි වර්ෂය සඳහා ද ක්‍රියාත්මක වනු ඇත.

******